**ශීර්ෂය - 203 - ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව**

**-------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 අප්‍රේල් 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අප්‍රේල් 27 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්ථන වැය විෂයය 01ක් සහ ප්‍රාග්ධන වැය විෂයය 01ක් සඳහා සලසා ගෙන තිබූ එකතුව රු. 100,000ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා පුනරාවර්ථන වැය විෂයයන් 15ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 03ක් සඳහා සලසා ගෙන තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු.10,587,154ක් හෙවත් සියයට 16 සිට සියයට 92 දක්වා වූ පරාසයකට අයත් ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි. | බුද්ධ ශාසන අමාත්‍යාංශය 2020 මැයි 20 දින නිකුත්කල අභ්‍යන්තර වියදම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2020 ප්‍රකාරව ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් අවම කර ගැනීමට කටයුතු කිරීම. | සපයාගත් ප්‍රතිපාදන අදාල කාර්යයට වැය කළ යුතු වීම. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව, සලසා තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා කිසිදු වියදමක් හෝ බැදීමක් ඇති කර නොගත යුතු වුවත් වැය විෂයය 01ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු 48,000ක් වූ ඉතිරිය ඉක්මවා රු 350,000ක් දක්වා බැරකම්වලට එළඹ තිබුණි. | 2020 වර්ෂයේ අතුරු සම්මත ගිණුම් 03ක් මගින් වියදම් කළමනාකරණය සඳහා අනුමැතිය ලබා දීම හේතුවෙන් දෙසැම්බර් මාසය සඳහා ප්‍රතිපාදන ඉතිරි කිරීමේ දී දෝෂයක් සිදු වී ඇති අතර මින් ඉදිරියට ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි ලබා ගැනීමට කටයුතු කරනු ලබයි. | ප්‍රතිපාදන ඉක්මවා වියදම් හෝ බැරකම් නොදැරිය යුතු වීම. |
| (ආ) | පෙර වර්ෂවල ගිණුම්ගත බැදීම් වෙනුවෙන් රු.13,429 ක් 2021 වර්ෂයේදි ගෙවා තිබුණද 2020 බැරකම් ලේඛනයේ එම වියදම සඳහන් කර නොතිබුණි. | එකී වියදම බැරකම් ලේඛනයේ වියදමක් ලෙස සටහන් කිරීමට කටයුතු කර ඇත. | සියළු බැරකම් බැරකම් ලේඛනයේ සටහන් කළ යුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) මුදල් රෙගුලාසි 134 (3) | අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2021වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි. | අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වීම. |
| (ආ) මුදල් රෙගුලාසි 106 සහ 113 | අනතුරකට ලක්ව වර්ෂ 5 ඉක්මවූ වාහනයට අදාලව රු.1,000,000 ක සහ ගංවතුරට හසුවී වර්ෂ 10 ඉක්මවූ නිල ඇඳුම් තොගයකට අදාලව රු.247,250 ක හානි සම්බන්ධයෙන් පාඩුව අයකර ගැනීමට හෝ අත්හැරීමට කටයුතු කර නොතිබුණි. | වෑන් රථයට අදාලව රක්ෂණයෙන් අයකර ගත නොහැකි වූ වටිනාකම පොත්වලින් කපා හැරීම සඳහා මු.රෙ.109 ආකෘති පත්‍රයක් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර නිල ඇඳුම් වලට සිදු වූ හානිය සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු සිදු කරනු ලබයි . | මුදල් රෙගුලාසි ප්‍රකාරව, අයකර ගැනීමට හෝ අත්හැරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) මුදල් රෙගුලාසි 102(ඉ) | 2019 සහ 2020 වර්ෂවල වාහන දෙකකට සිදුවූ අනතුරුවලට අදාලව පිළිවෙලින් රු.137,706 ක් සහ රු.22,600 ක් වූ අලාභ, හානි/පාඩු ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | මු.රෙ 104(4) යටතේ අවසාන පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කෙරෙමින් පවති. | හානි/පාඩු අදාල ලේඛනයේ ඇතුළත් කළ යුතු වීම. |

## 3. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 66 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩල 50 ක් වුයෙන් නිලධාරින් 16 දෙනෙකු ගේ පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කර ඇත. | අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 ඡේදය පරිදි, වැඩ බැලීමේ පත්වීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් සිදු කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වන අතර තනතුරට පූර්ණකාලින නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්වීම නොපමාව කළ යුතු විය. එසේ වුවද, පුරප්පාඩු වූ අධ්‍යක්ෂ තනතුර සඳහා පත් කර තිබූ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරිය 2018 අගෝස්තු 01 දින සිට 2020 ජනවාරි 08 දින දක්වා රාජකාරි ඉටුකිරීමේ පදනම මත ද 2020 ජනවාරි 09 දින සිට 2021 අප්‍රේල් දක්වා වැඩ බැලීමේ පදනම මතද අඛණ්ඩව රාජකාරි කරනු ලබන අතර ඒ සඳහා නිත්‍ය පත්වීමක් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය වන තනතුරක් වන බැවින්ද අධ්‍යක්ෂ තනතුරෙහි පුරප්පාඩුව පිරවීම දෙපාර්තමේන්තු වපසරියෙන් බැහැර කරුණක් වන බවද කාරුණිකව දන්වා සිටිමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව නිත්‍ය පත්වීමක් සිදු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | දෙපාර්තමේන්තුව සඳහා අනුමත රියැදුරු තනතුරු 02 ක් පැවතියද එක් තනතුරක් 2020 ජනවාරි 28 දින සිට පුරප්පාඩු වී පැවතුණි. ඒ හේතුවෙන් දෙපාර්තමේන්තුව සතුව පවතින වාහන දෙකෙන් එකක් එදින සිට නිශ්කාර්යව පැවතුණි. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2017/04 අනුව සෑම කාර්තුවකම කාර්ය මණ්ඩල වාර්තාවෙහි ඉහත සඳහන් රියදුරු තනතුර පුරප්පාඩු බව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. | රියැදුරු තනතුරට අදාල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |